සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Department of Education, Southern Province

## පළමු වාර පරීක්ෂණය 2019 මාර්තු
## First Term Test, March 2019

10 ශ්‍රේණිය
Grade 10

## පුරවැසි අධ්‍යාපනය - I

පැය එකයි
One hour

උපදෙස් :
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40ක් හිමි වේ.
- 1 සිට 20 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

---

01 සප්ත අපරිහානිය ධර්ම අනුගමනය කරමින් සමූහාණ්ඩු ක්‍රමය පවත්වා ගෙන ගිය ඉන්දියානු ජනපදය, වන්නේ,
(1) මල්ල (2) වජ්ජි (3) මගධ (4) කෝසල

02 පුරවැසි සභාව ප්‍රධාන පාලන ආයතනය වූ ග්‍රීක පෞර රාජ්‍යය වන්නේ,
(1) ඇතැන්ස් (2) ලාගාෂ් (3) නිප්පූර් (4) ක්‍රීටය

03 ක්‍රි. ව. 5 සියවසේ සිට 15 වන සියවස දක්වා යුරෝපයේ පැවති ඉඩම් භුක්තිය හා බැඳුණු සේවාවන් සැපයීම මත පදනම් වූ කෘෂි ආර්ථික රටාව හැඳින්වූයේ,
(1) වෙළඳපොළ ක්‍රමය යනුවෙනි (2) වැඩවසම් ක්‍රමය යනුවෙනි.
(3) ධනවාදී ක්‍රමය යනුවෙනි (4) සමාජ වාදී ක්‍රමය යනුවෙනි

04 1688 දී සිදු වූ උත්කෘෂ්ට විප්ලවය ................................................. විප්ලවය යනුවෙන් හැඳින්වේ.
(1) ප්‍රංශ (2) රුසියන් (3) ඉංග්‍රීසි (4) ඇමෙරිකන්

05 යුරෝපයේ ජාතික රාජ්‍ය සංකල්පය ශක්තිමත් පදනමකට ගෙන ඒම සඳහා උපකාරී වූ අදහස් ඉදිරිපත් කළ චින්තකයෙකු වන්නේ,
(1) තෝමස් එඩිසන් ය. (2) චාර්ල්ස් එල්වුඩ් ය.
(3) විලියම් ෂේක්ස්පියර් ය. (4) නිකොලායි මැකියාවෙලී ය.

06 ශ්‍රී ලංකාවේ ජීවත්වන පුද්ගලයකු හට සර්වජන ඡන්ද බලය හිමි වන වයස් සීමාව වන්නේ,
(1) අවුරුදු දහසය යි. (2) අවුරුදු දහ අටයි.
(3) අවුරුදු විසි එකයි. (4) අවුරුදු විසි පහයි.

07 ප්‍රජාතන්ත්‍රවාදය ජනතාව උදෙසා ජනතාව විසින් ගෙනයන පාලන ක්‍රමයක් බව ප්‍රකාශ කළ ඇමෙරිකානු ජනාධිපතිවරයා,
(1) මාර්ෂල් ටිටෝ මහතාය. (2) බැරක් ඔබාමා මහතාය.
(3) ඒබ්‍රහම් ලින්කන් මහතාය. (4) ජෝර්ජ් මාර්ෂල් මහතාය.

08 රට තුළ නීත්‍යානුකූල එක් දේශපාලන පක්ෂයක් පමණක් ක්‍රියාත්මක වන රටකට නිදසුනක් වන්නේ,
(1) ඉන්දියාව යි. (2) චීනය යි.
(3) මහා බ්‍රිතාන්‍යය යි. (4) ඇමරිකා එක්සත් ජනපදය යි.

09 ව්‍යවස්ථාදායකයට මහජන නියෝජිතයන් පත්කර ගැනීම සඳහා වර්තමානයේ දී ශ්‍රී ලංකාව භාවිත කරන ක්‍රමවේදය කවරක් ද?
(1) ජනමත විචාරණය (2) ජනාධිපතිවරණය
(3) පළාත්බද නියෝජනය (4) සමානුපාතික නියෝජනය

10 ඡන්ද කොට්ඨාස අනුව නියෝජිතයන් තෝරා ගැනීමෙන් අත්වන වාසියක් සඳහන් වන පිළිතුර කුමක් ද?
(1) ප්‍රාදේශීය සංවර්ධනයට ඉඩ ප්‍රස්ථා ලැබීම
(2) ආණ්ඩු පක්ෂය විවේචනය කළ හැකි වීම
(3) සාමකාමී මැතිවරණ පැවැත්විය හැකි වීම
(4) ජනතා සිතුම් පැතුම් ඉටු කිරීමට අවස්ථා ලැබීම

11 ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය යටතේ සර්වජන ඡන්ද බලය මගින් සැබෑ ලෙස ක්‍රියාවට නැංවෙන ජනතාව සතු බලය වන්නේ,

(1) පරමාධිපත්‍යය යි. (2) ස්වාධිපත්‍යය යි. (3) ආධිපත්‍යය යි. (4) සර්වාධිපත්‍යය යි.

12 නිදහස් හා සාධාරණ මැතිවරණයක ලක්ෂණයක් වන්නේ,

(1) දේශපාලනයට නියෝජිතයන් පත්කර ගැනීමයි.

(2) පාලකයන් මැතිවරණ නීතිවලට යොමු කරවීමයි.

(3) නියමිත කාලය තුළ මැතිවරණය පැවැත්වීමයි.

(4) මැතිවරණය නොපවත්වා පාලනය කිරීමයි.

13 රටක යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය ඉටු කරනු ලබන්නේ,

(1) විධායකය යි. (2) පාර්ලිමේන්තුව යි. (3) ජනමාධ්‍යය යි. (4) අධිකරණය යි.

14 රාජ්‍යයේ කැමැත්ත ප්‍රායෝගික වශයෙන් ක්‍රියාවට නංවන්නේ,

(1) පළාත් සභාවයි. (2) ත්‍රිවිධ හමුදාවයි. (3) පොලීසිය යි. (4) ආණ්ඩුවයි.

15 පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක දේශපාලන විධායකය වන්නේ,

(1) ජනාධිපති ප්‍රමුඛ ඇමති මණ්ඩලය යි. (2) අගමැති ප්‍රමුඛ ඇමති මණ්ඩලය යි.

(3) කථානායක ප්‍රමුඛ මන්ත්‍රී මණ්ඩලය යි. (4) සභානායක ප්‍රමුඛ කාර්යය මණ්ඩලය යි.

16 ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියකු සතු අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම් වර්ග දෙක ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) නීතිමය හා සදාචාරාත්මක යුතුකම් (2) දේශපාලන හා සමාජීය යුතුකම්

(3) නීතිමය හා හෘද සාක්ෂියේ යුතුකම් (4) ආර්ථික හා දේශපාලන යුතුකම්

17 ප්‍රජාතන්ත්‍රවාදයේ ශක්තිමත් පැවැත්ම කෙරෙහි බලපාන ප්‍රධාන සාධකයකි.

(1) පුද්ගල දක්ෂතා ප්‍රශස්ත ලෙස දියුණු කිරීම

(2) ජනතාවට සාධාරණත්වයෙන් සැලකීම

(3) මූලික මිනිස් අවශ්‍යතා ප්‍රශස්ත ලෙස ඉටු කිරීම

(4) විවිධ මිනිස් චර්යාවන් සංවර්ධනයට බාධා කිරීම

18 A - ව්‍යවස්ථාදායකය මගින් සෘජුව විධායකය පාලනය නොවේ.

B - විධායකය ඉවත් කිරීමට ව්‍යවස්ථාදායකයට හැකිය

C - රාජ්‍යයේ මෙන්ම ආණ්ඩුවේ නායකයා ජනාධිපතිය.

D - සමානාත්මතා මූලධර්මය ආරක්ෂා කරමින් කටයුතු කරයි.

- ජනාධිපති ආණ්ඩු ක්‍රමයක ලක්ෂණ සඳහන් ප්‍රකාශ වන්නේ,

(1) A හා C ය. (2) A හා D ය. (3) B හා C ය. (4) C හා D ය.

19 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ශ්‍රී ලාංකිකයන්ට වඩාත් වැදගත් වන්නේ,

(1) රාජ්‍ය නිලධාරීන් පත් කිරීම නිසාය. (2) පාර්ලිමේන්තුව හඳුන්වා දීම නිසාය

(3) අග්‍රාණ්ඩුකාර ධුරය හඳුන්වා දීම නිසාය. (4) සර්වජන ඡන්ද බලය ලැබීම නිසාය.

20 ප්‍රජාතන්ත්‍රවාදය පාලන ක්‍රමයක් ලෙස වැදගත් වන්නේ,

(1) සමානාත්මතාවයෙන් කටයුතු කරන නිසාය.

(2) යුතුකම් අගයන සමාජයක් වීම නිසාය.

(3) මහජන කැමැත්ත මත පාලනය සිදුවන නිසාය.

(4) අයිතිවාසිකම් භුක්ති විඳීමට හැකිවන නිසාය (ලකුණු 2 x 20 = 40)

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

පළමු වාර පරීක්ෂණය 2019 මාර්තු
First Term Test, March 2019

10 ශ්‍රේණිය
Grade 10

පුරවැසි අධ්‍යාපනය - II

පැය දෙකයි
Two hours

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමි වේ.

---

(01) (i) ග්‍රීක පෞර රාජ්‍යයන්හි පාලනයට සහභාගි කර නොගත් දෙපිරිසක් සඳහන් කරන්න.

(ii) අතීතයේ සිට ලෝකයේ විවිධ රාජ්‍යයන් භාවිත කළ පාලන ක්‍රම දෙකක් නම් කරන්න.

(iii) ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රධාන ස්වරූප දෙක නම් කරන්න.

(iv) රාජ්‍යයන්ගේ ප්‍රධාන ස්වරූප දෙක ලියන්න.

(v) ද්වි පක්ෂ ක්‍රමය ක්‍රියාත්මක වන රටවල් දෙකක් සඳහන් කරන්න.

(vi) ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කිරීම සඳහා භාවිතා කරන ප්‍රධාන නිර්ණායක දෙක සඳහන් කරන්න.

(vii) ආණ්ඩුව සමන්විත වන ප්‍රධාන ආයතනවලින් දෙකක් ලියන්න.

(viii) රාජ්‍යයකට පැවරෙන කාර්යයන් දෙකක් ලියන්න.

(ix) ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතට අයත් වන මැතිවරණ දිස්ත්‍රික්ක දෙකක් නම් කරන්න.

(x) රටක් තුළ නීතියේ ආධිපත්‍යය පවතින බව විදහාපාන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(ලකුණු 2 x 10 = 20)

(02) (i) ප්‍රජාතන්ත්‍රවාදී පාලනයේ සාර්ථකත්වයට, විරුද්ධ පක්ෂයෙන් ඉටුවිය යුතු කාර්යයන් දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) ඍජු ප්‍රජාතන්ත්‍රවාදය වර්තමානයේ ක්‍රියාත්මක කිරීමේදී මතුවන ගැටලු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) තරගකාරී දේශපාලන පක්ෂ ක්‍රමයක යහපත් ලක්ෂණ තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(03) (i) ''සමානාත්මතාවය'' යනුවෙන් අදහස් වන්නේ, කුමක් ද? (ලකුණු 02)

(ii) රටක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව කටයුතු කිරීමෙන් අත්වන වාසි තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පැවැත්මට ජනමාධ්‍යය මගින් ඉටු කළ යුතු කාර්යයන් තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

04) (i) ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායකයට පැවරී ඇති කාර්යයන් දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 28 වන ව්‍යවස්ථාවේ සඳහන් පුරවැසි යුතුකම් තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක ලක්ෂණ තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

05) (i) රාජ්‍යය පිළිබඳ නිර්වචන ඉදිරිපත් කර ඇති පුද්ගලයන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

(ii) යුරෝපා රටවල් ප්‍රබල ජාතික රාජ්‍යයන් ලෙස නැගීසිටීමට බලපෑ හේතු තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) (a) ජාතික රාජ්‍යයක ලක්ෂණ තුනක් ද,

(b) ජාතික රාජ්‍යයක් බිහිවීමට බලපෑ සාධක දෙකක් ද සඳහන් කරන්න. (ලකුණු 05)

06) (i) ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියෙකු සතු විය යුතු ගුණාංග දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් සාර්ථක වීමට අවශ්‍ය සාධක තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක වැදගත්කම කරුණු තුනක් ඇසුරින් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)